2023/11/22
2023/12/01



IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණය

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)**

## BLE 301- මානව සම්පත් කළමනාකරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. "මානව සම්පත් කළමනාකරණය වත්මන් ආයතනික සැකසුම්වල ප්‍රධාන අංගයක් බවට පත්ව ඇත."

i. ඉහත ප්‍රකාශය පැහැදිලි කර සංවිධානයකට මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම දක්වන්න.

ii. වර්තමාන සන්දර්භය තුළ මානව සම්පත් කළමනාකරණය ආශ්‍රිත අභියෝගාත්මක කාර්යයන් මොනවාද?

(ලකුණු 10 x 2 = 20)

02.

i. සේවක බඳවා ගැනීම් සහ සේවක තෝරා ගැනීම් අතර වෙනස පැහැදිලි කරන්න.

ii. සේවක බඳවා ගැනීම් සහ තෝරා ගැනීමේ ක්‍රියාවලිය තුළ ඇතිවිය හැකි දෝෂ හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10 x 2 = 20)

03.

i. අභ්‍යන්තර බඳවා ගැනීම් සෑම විටම හොඳම බඳවා ගැනීමේ ක්‍රමයයි. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?

ii. කුඩා පරිමාණ සංවිධානයක පරිපාලන නිලධාරි තනතුර සඳහා කාර්ය සාධන තක්සේරු පෝරමයක් සකස් කරන්න.

(ලකුණු 10 x 2 = 20)

04.

i. සේවක දුක්ගැනවිලි සහ සේවක ආතතිය අතර වෙනස කුමක්ද?

ii. රැකියා ආශ්‍රිත සේවක දුක්ගැනවිලි කළමනාකරණය කිරීමට සුදුසු යාන්ත්‍රණයක් සකස් කරන්න.

(ලකුණු 10 x 2 = 20)

05.

i. වත්මන් ආයතනික සැකසුම තුළ සේවක සබඳතා සහ කාර්මික සබඳතා අතර වෙනස කුමක්ද?

ii. වර්තමාන සන්දර්භය තුළ කාර්මික සාමයට බාධා කළ හැකි හේතු සාකච්ඡා කරන්න.

(ලකුණු 10 x 2 = 20)

06.

i. තෝරාගත් සංවිධානයක් සඳහා ක්‍රමවත් විනය පටිපාටියක් සකස් කරන්න. ඔබේ පිළිතුර තුල විනය පරිපාටියක තිබිය යුතු පියවරයන් දක්වන්න.

ii. කාර්මික සාමය සඳහා ඇති විය හැකි බාධා සහ කාර්මික සාමයේ ප්‍රධාන අංග පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 10 x 2 = 20)

***************

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණය

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)

# B BLE 302 - ජනගහන අධ්‍යයනය සහ මිනිස්බල සැලසුම්කරණය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(1)** **ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

ඇ)   ප්‍රජාවිද්‍යාව සහ ජනගහන අධ්‍යයනය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ)   ප්‍රජාවිද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කිරීමේදී භාවිතා කළ හැකි දත්ත මූලාශ්‍ර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ)   ප්‍රජාවිද්‍යාත්මක සංරචක සහ ජනගහනයේ මූලිකාංග අතර ඇති සබඳතාවය ශ්‍රමබලකාය උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 25)**

02.

අ)   ශ්‍රී ලංකාව වැනි රටකට මිනිස්බල සැලසුම් සිදුකිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ)   "ශ්‍රමබලකා අධ්‍යයනයන් සිදුකිරීමේදී ජනගහන වෙනස්කම් පිළිබඳව අවධානය යොමුකිරීම වැදගත් වේ". පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

03.

අ)   රටක සංවර්ධනය මිනුම්කරණය කිරීමේදී භාවිතා කළ හැකි මර්තෲතා සහ සංක්‍රමණ දර්ශක දෙක බැගින් විස්තර කරන්න.

(ලකුණු 08)

ආ)   ලබා දී ඇති දත්ත භාවිතා කරමින් පහත මිනුම් ගණනය කරන්න.

| වයස් කාණ්ඩය | අදාල වයසේ ස්ත්‍රීන් බිහිකළ සජීවී උපත් සංඛ්‍යාව | අදාල වයසේ ස්ත්‍රීන්ගේ මරණ සංඛ්‍යාව | අදාල වයසේ ස්ත්‍රී ජනගහනය |
|---|---|---|---|
| 15-19 | 18,258 | 11,274 | 986,000 |
| 20-24 | 77,447 | 8,726 | 968,000 |
| 25-29 | 120,105 | 10,989 | 828,000 |
| 30-34 | 94,883 | 10,565 | 797,000 |
| 35-39 | 43,868 | 7,899 | 768,000 |
| 40-44 | 11,428 | 9,978 | 723,000 |
| 45-49 | 1,143 | 11,242 | 631,000 |

I. සාමාන්‍ය සඵලතා අනුපාතිකය

II. වයස්-විශේෂිත සඵලතා අනුපාතික

III. මුළු සඵලතා අනුපාතිකය

IV. ස්ත්‍රී-වයස් විශේෂිත මරණ අනුපාතික

(ලකුණු 15)

ඇ) ඔබ ලබාගත් පිළිතුරු පිළිබඳ කෙටි විවරණයක යෙදෙන්න.

(ලකුණු 02)

**(මුළු ලකුණු 25)**

04.

අ) ඇරිස්ටෝටල් සහ ප්ලේටෝගේ ජනගහන විශ්ලේෂණයන්හි වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) ශ්‍රමබලකා අධ්‍යයනයන්හිදී සංක්‍රමණයේ ඇති අදාළත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ) "මිනිස් බල සැලසුම සකස් කිරීමේදී අනාගත ජනගහනයේ සිදුවිය හැකි වෙනස්කම් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ". සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

05.

අ) ශ්‍රම සැපයුම සහ ශ්‍රම ඉල්ලුම අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) පහත සඳහන් මිනුම් කෙටියෙන් පැහැදිලි කරන්න

I. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය

II. රැකියා නියුක්ත අනුපාතිකය

III. රැකියා වියුක්ත අනුපාතිකය

(ලකුණු 06)

ඇ) ශ්‍රම බලකායේ උපරිම ඵලය ලබා ගැනීමට හැකි හොඳම අවස්ථාව ප්‍රජාවිද්‍යාත්මක පාරිතෝෂිතයයි. පැහැදිලි කරන්න.

(ලකුණු 14)

**(මුළු ලකුණු 25)**

06.

ආ) ශ්‍රී ලංකාවේ වර්තමාන ශ්‍රම බලකා රටා සහ ප්‍රවණතා ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තා ප්‍රයෝජනයට ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) මෑත කාලීනව මිනිස් බල සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය මට්ටමින් ක්‍රියාත්මක වූ ප්‍රතිපත්තීන් පිළිබඳව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

***************

010

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණය

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)

## BLE 303 - ශ්‍රම ආර්ථික විද්‍යාව

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**ප්‍රශ්නය 01**

1) ශ්‍රම වෙළඳපොළ අනෙකුත් වෙළඳපල වලින් වෙනස් වන ආකාර තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

2) ශ්‍රම ආර්ථික විද්‍යාවේ භාවිතා වන පරිදි හීන වන ආන්තික ඵලදාව නිර්වචනය කරන්න.

(ලකුණු 05)

3) සුදුසු රූප සටහනක් භාවිතා කරමින්, ශ්‍රම වෙළඳපොල සමතුලිතතා සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

4) ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාකය භාවිතයෙන් ශ්‍රම සැපයුම් වක්‍රය පැහැදැලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්නය 02**

සුදුසු රූප සටහන් හා සමීකරණ භාවිතයෙන් පහත සිදුවීම් ශ්‍රම වෙළඳපොල සමතුලිතතාවයට ඇතිකරන බලපෑම පැහැදිලි කරන්න.

1) බස් රථ රියදුරන්ගේ වැටුප් වැඩි කිරීම.

(ලකුණු 04)

2) කෝපි නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට රොබෝවරු භාවිතය ආරම්භ කරයි.

(ලකුණු 04)

3) කෝපි සඳහා ඇති අනුපූරකයක මිල අඩක් අඩු වේ.

(ලකුණු 04)

4) ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් පුහුණු ශ්‍රමිකයින් විශාල සංඛ්‍යාවක් ස්ථිරවම වෙනත් රටවලට සංක්‍රමණය වේ.

(ලකුණු 04)

5) ආර්ථිකයේ ඉහළ උද්ධමන තත්ත්වය මගහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාත අඛණ්ඩව වැඩි කළ අතර එය නිෂ්පාදන පිරිවැය ඉහළ යන බැවින් ව්‍යාපාරික අංශයට අහිතකර ලෙස බලපායි.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්නය 03

1) ශ්‍රම ඉල්ලුම වක්‍රය විතැන් වීමට බලපාන හේතු මොනවා ද?උදාහරණ හතරක් යොදාගෙන පැහැදිලි කරන්න?

(ලකුණු 05)

2) ශ්‍රම සැපයුම වක්‍රය විතැන් වීමට හේතු මොනවා ද? උදාහරණ හතරක් යොදාගෙන පැහැදිලි කරන්න?
(ලකුණු 05)

3) ශ්‍රම ඵලදායිතාවයේ නිර්ණායක තුනක් නම් කර පැහැදිලි කරන්න?
(ලකුණු 05)

4) අනෙකුත් සාධක වෙළෙඳපොළවල් ශ්‍රම වෙළඳපොළ සමඟ ඇති සම්බන්ධය පැහැදිලි කරන්න?

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්නය 04

පහත මාතෘකා හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1) නාමික වැටුප්
(ලකුණු 05)

2) මූර්ත වැටුප්
(ලකුණු 05)

3) ශ්‍රමයේ ආන්තික ඵලදාව
(ලකුණු 05)

4) ශ්‍රම ඉල්ලුම (ලකුණු 05)

5) කෙටි කාලීන සහ දිගු කාලීන නිෂ්පාදනය.

(ලකුණු 05)
**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්නය 05

1) සේවා වියුක්ති අනුපාතය නිර්වචනය කරන්න. (ලකුණු 05)

2) සේවා වියුක්තිය ආර්ථිකයක ඕනෑම අවස්ථාවක පැවතිය හැක්කේ ඇයි? (ලකුණු 05)

3) ස්වභාවික සේවා වියුක්තිය අනුපාතය යනු කුමක්ද? (ලකුණු 05)

4) සේවා වියුක්තියට හේතු ගණනාවක් තිබේ. අවශ්‍ය උදාහරණ යොදාගෙන ඒවායින් තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්නය 06**

ශ්‍රම ඉල්ලුම් වැටුප් නම්‍යතාවය මගින් ශ්‍රමයේ කේවල් කිරීමේ ශක්තිය තීරණය වේ.

1) ශ්‍රම ඉල්ලුම් වැටුප් නම්‍යතාවය තීරණය වන සාධක මොනවාද?

(ලකුණු 06)

2) ශ්‍රම සැපයුම් වැටුප් නම්‍යතාවය තීරණය වන සාධක මොනවාද?

(ලකුණු 06)

3) ශ්‍රම ඉල්ලුම කෙටි කාලයට සාපේක්ෂව දිගු කාලයේදී වැටුපට වැඩි නම්‍යතාවයක් දක්වන්නේ මන් ද?

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්නය 07**

1) ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය අඩු වීමට හේතු පහක් නම් කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

2) උදාහරණ ලබා දෙමින් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනයෙන් වෙනස් වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න?

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

************

007

IHRA

UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය III කොටස - ප්‍රථම පුනර් පරීක්ෂණය

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 ඔක්තෝබර්)

## BLE 304- වෘත්තීය සමිතිවාදය සහ ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(1)** **ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. වෘත්තීය සමිති සහ වෘත්තීය සමිතිවාදය යන්න විභාග කරන්න.

(මුළු ලකුණු 25)

02. වෘත්තීය සමිති සහ වෘත්තීය සමිතිවාදය හැදෑරීමේදී හමුවන න්‍යායික ප්‍රවේශ සහ වර්ගීකරන පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 25)

03. වෘත්තීය සමිතිවල කාර්යභාරය සහ වැදගත්කම පරීක්ෂා කරන්න.

(මුළු ලකුණු 25)

04. ලෝකයේ වෘත්තීය සමිති ආරම්භ වූ පසුබිම සහ ඒවා ලොව පුරා ව්‍යාප්තවීමට බලපෑ හේතු සාධක විමර්ශනය කරන්න.

(මුළු ලකුණු 25)

05. ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය බිහි වූ පසුබිම පිළිබඳ විමසීමක යෙදෙන්න .

(මුළු ලකුණු 25)

06. ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ඉතිහාසය තුළ ගුණසිංහ අවධියේ ස්වභාවය සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 25)

07. වාමාංශික අවධිය ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයට කළ බලපෑම පරීක්ෂා කරන්න.

(මුළු ලකුණු 25)

08. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. කාර්මික විප්ලවය

ii. කම්කරු පන්තිය

iii. ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ අවිධිමත් අවධිය

iv. 1953 හර්තාලය

v. 1980 ජූලි වැඩ වර්ජනය

(මුළු ලකුණු 25)

*******